සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 සිංහල ලේඛනයේ දී භාවිතවන සඤ්ඤක අක්ෂර ගණන

(i) 6 කි. (ii) 4 කි. (iii) 5 කි. (iv) 3 කි.

02 අල්පප්‍රාණ අක්ෂර පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(i) ක, ජ, ඨ, ප, හ (ii) ක, හ, ඵ, බ, හ (iii) ක, ළ, ඡ, ස, හ (iv) ක, ච, ට, ත, ප

03 ප්‍රථම පුරුෂ, ඒක වචන, ස්ත්‍රී ලිංග, අතීතකාල ක්‍රියා පදය තෝරන්න.

(i) කරන්නීය. (ii) කළේය. (iii) කළහ. (iv) කළාය.

04 උක්ත නාම පද දෙක් සහ අනුක්ත නාම පද දෙකක් පමණක් ඇති පිළිතුර තෝරන්න.

(i) අපි, සර්පයෙක්, මා, වෛද්‍යවරු (ii) දූරියක්, අප, ගුරුවරු, මවක

(iii) මා, ඔවුන්, ළමයින්, ගැහැණියක් (iv) අප, මා, තොප, ඔවුහු

05 ඉස්පිල්ල පමණක් ම යෙදුණු වචනය තෝරන්න.

(i) පිහිටි (ii) පීල්ල (iii) ප්‍රීතිය (iv) පිදුරු

- **අංක 06 සිට 08 තෙක් ප්‍රශ්නවල විරුද්ධාර්ථ පදය තිත් ඉරිමත ලියන්න.**

06 ආනයන ..................................................................

07 සොම්නස ..................................................................

08 දුදන ..................................................................

- **අංක 09 සිට 11 තෙක් ප්‍රශ්නවල සමානාර්ථ පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

09 ඇතා (i) හය (ii) සිංහ (iii) සක්‍ර (iv) හස්ථියා

10 මුහුණ (i) මහී (ii) වත (iii) සළු (iv) සිසි

11 සයුර (i) නදිය (ii) විල (iii) සිඳු (iv) හොය

- **අංක 12 සිට 14 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු උක්ත පදය වරහන් තුළින් තෝරා තිත් ඉරිමත ලියන්න.**

12 .................................................................... මියුරු ගීතයක් ගැයුවා ය. (ගායිකාවක / ගායිකාවෝ / ගායිකාවක්)

13 ගස මුල සිටි ...................................................................... ක්‍රීඩා පිටියට දිව ගියහ. (ළමයින් / ළමයි / ළමයෙක්)

14 ........................................................... මල් ආසනය පිරිසිදු කරයි. (උපාසිකාවක / උපාසිකාවෝ / උපාසිකාව)

15 පහත සඳහන් වාක්‍යයෙහි තිබෙන නාම විශේෂණ පද 2 ක් උපුටා තිත් ඉරිමත ලියන්න.

දඟකාර ළමයා උස ගසට නැග ඉදුණු අඹ කැඩුවේ ය.

1. ........................................................ 2. ............................................................

16 පහත වාක්‍යයේ හිස්තැනට සුදුසු වඩාත් ගැළපෙන ක්‍රියා විශේෂණ පදයක් වරහන් තුළින් තෝරා තිත් ඉරිමත ලියන්න.

තොටියා ඔරුවෙන් බැස .......................................... (රිද්මයට / පරිස්සමට / කඹයෙන්) ඔරුව ගොඩට අදියි.

- **අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවලට සුදුසු ආඛ්‍යාත පද වරහන් තුළින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

(කරති / වෙති / කරයි / වූහ / වන්නෝය / වෙයි)

17 කාන්තාරයේ නෞකාව හෙවත් ඔටුවා කාන්තාර ප්‍රදේශවල ජීවත් ........................................

18 රථ පෙළ පාරේ පේළියට ගමන් ...................................................

19 පියුම්හු පරිසරය අලංකාර ...........................................................

20 පහත සඳහන් වාක්‍යය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉරිමත ලියන්න.

හාහාමමඑහෙමත්කරනවදකියලාඉබ්බාලීකෝටුවකටින්ඩැහැගත්තා

..................................................................................................................................................

(ලකුණු 2 x 20 = 40)

**6 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - II කොටස**

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) ජනශ්‍රැතියට අයත් අංග දෙකක් ලියන්න.

(ii) බුදුරජාණන් වහන්සේගේ පූර්ව ජන්ම පිළිබඳ කතා ඇතුළත් කෘතියේ නම හා එය ලියැවුණු යුගය ලියන්න.

(iii) ප්‍රබන්ධෝපදේශය ලියන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) පහත කාව්‍ය ග්‍රන්ථ රචනා කිරීම සඳහා පාදක කොටගත් ජාතක කතා මොනවා ද?

(අ) ගුත්තිල කාව්‍යය -

(ආ) කාව්‍යශේඛරය -

(v) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක පමණක් අක්ෂර වින්‍යාසය වැරදිය. එම වචන දෙක පමණක් නිවැරදි කර ලියන්න.

පැරනි ලාංකිකයාගේ ආහාර රටාව විවිදත්වයෙන් මෙන්ම පෝෂණ ගුණයෙන් යුතු විය.

(vi) පහත සඳහන් කථන ව්‍යවහාරයේ ඇති වාක්‍යය ලිඛිත ව්‍යවහාරයෙන් ලියන්න.

තාත්තා කුඹුරට ගිහින් වක්කඩ බැන්දා

(vii) පහත සඳහන් උක්ත පදවල අනුක්ත පදය ලියන්න.

(අ) වෙළෙන්දියක් (ආ) පියෙක්

(ඇ) තොපි (ඈ) පාලකයෝ (ලකුණු 2 x 7 = 14)

02 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) සාරධර්ම සුරකිමු.

(ii) වන සම්පත ආරක්ෂා කරමු.

(iii) ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමේ වැදගත්කම.

(iv) මා ගිය අධ්‍යාපන චාරිකාව (ලකුණු 16)

03 පහත සඳහන් අවස්ථා දෙකින් එකකට පමණක් පිළිතුරු සපයන්න.

(අ) ඔබගේ හොඳම යෙහෙළියගේ/යහළුවාගේ උපන් දින සැමරුම සඳහා සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න.

<u>නැතහොත්</u>

(ආ) ඔබේ අත්තම්මා රෝගාතුර වී රෝහල් ගත කර ඇති බැවින් ඇය බැලීමට ඇගේ ගමට යන බවත්, දින කිහිපයක් එහි නතරවී සිටින නිසා ඔබේ හොඳම යාළුවාගේ උපන් දින උත්සවයට සහභාගි විය නොහැකි බවත්, දන්වමින් තම යහළුවාට යවන ලිපිය ලියන්න. (ලකුණු 10)

04 පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කලා වැවේය. මෙය කළු ගල කපා සාදා ඇත. මේ වාන මෑත කාලයන්හි ප්‍රතිසංස්කරණයෙහි දී පවා එසේ ම තිබෙන්නට ඉඩ හැර ඇත. මෙය අඩි 216 ක් පළල අඩි 170 ක් දිගු එකකි. මෙය එකල නිර්මාණය කෙරුණු පුදුමාකාර නිර්මාණයකි. එකල සිටි ශිල්පියාගේ ඉවසිලිවන්තකමත් දක්ෂ බවත් මින් පිළිඹිඹු කෙරේ. විසල් වැවක තවත් වැදගත් අංගයක් ලෙස රළපනාව හඳුන්වා දිය හැකිය. මෙය දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් හානි පැමිණීම වැළැක්වීම සඳහා යොදාගෙන ඇත්තකි. දිය රැල්ලෙන් වැව් බැම්ම ආරක්ෂා වීම මෙම නිර්මාණය නිසා සිදු වේ.

(i) ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කොහි ද?

(ii) මෙය නිර්මාණය කර ඇත්තේ මොනවායින් ද?

(iii) මෙහි සඳහන් වැවක තවත් වැදගත් අංගය කුමක් ද?

(iv) එය වැවට අත්‍යාවශ්‍ය අංගයක් වීමට හේතුව කුමක් ද?

(v) සඤ්ඤක අක්ෂර යෙදුණු වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. (ලකුණු 2 x 5 = 10)

05 (i) පහත වර්තමාන කාල වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරිය රෝගියා පරීක්ෂා කරයි.

(ආ) ක්‍රීඩකයෝ තරගය ජය ගනිති.

(ඇ) කම්කරුවා තමාට පැවරුණු කාර්යය ඉටු කරයි.

(ඈ) බාලිකාවෝ මනහර රැඟුමක් ඉදිරිපත් කරති.

(ඉ) තොපි ගමට යහු. (ලකුණු 1 x 5 = 05)

(ii) පහත උද්ධෘත කවුරුන් විසින් කා හට ප්‍රකාශ කරන ලද්දයි ලියන්න.

(අ) ''හා, හා, මම එහෙමත් කරනව ද?''

(ආ) ''ගහ අතගාල බැලුවට කාරියක් නෑනෙ''

(ඇ) ''බොහොම ඉක්මනට ආවා නේද?'' (ලකුණු 1 x 3 = 03)

(iii) පහත කවිය සම්පූර්ණ කරන්න.

වනේ ගිජිදාය දුටුවොත් වනසාය

.........................................................................................

.........................................................................................

......................................................................................... (ලකුණු 2 x 1 = 02)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | iii | (02) | iv | (03) | iv | (04) | ii | (05) | i | (06) | අපනයන |
| (07) | දොම්නස | (08) | සුදන | (09) | iv | (10) | ii | (11) | iii | (12) | ගායිකාවක් |
| (13) | ළමයි | (14) | උපාසිකාව | (15) | දඟකාර, උස, ඉඳුණු | | | (16) | පරිස්සමට | (17) | වෙයි |
| (18) | කරයි | (19) | කරති | | | | | | | | |

(20) ''හා, හා, මම එහෙමත් කරනව ද?'' කියලා ඉබ්බා ලීකෝටුව කටින් ඩැහැ ගත්තා.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01. (i) ජනකතා, ජනකවි, පිරුළු, ජන නාටක, උපහැරණ
(ii) පන්සිය පනස් ජාතක පොත, කුරුණෑගල යුගය
(iii) මුනිදාස කුමාරතුංග
(iv) (අ) ගුත්තිල ජාතකය (ආ) සත්තුභත්තක ජාතකය
(v) පැරණි, විවිධත්වයෙන්
(vi) තාත්තා කුඹුරට ගොස් වක්කඩ බැන්දේ ය.
(vii) (අ) වෙළෙන්දියක (ආ) පියෙකු
(ඇ) තොප (ඈ) පාලකයන් (ලකුණු 2 x 7 = 14)

02. මාතෘකාවට අනුව කරුණු සඳහා ලකුණු 5 යි.
සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව සඳහා ලකුණු 8 යි.
ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 3 යි. (මුළු ලකුණු 16 යි.)

03. ආකෘතිය ලකුණු 3 යි.
අඩංගු කරුණු ලකුණු 5 යි.
ශිල්පීය දක්ෂතා ලකුණු 2 යි. (මුළු ලකුණු 10 යි.)

04. (i) කලා වැවේ (ii) කළුගල්වලින් (iii) රළපනාව
(iv) දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් සිදුවන හානිය වැළැක්වීම සඳහා
(v) පිළිඹිබු (ලකුණු 2 x 5 = 10)

05. (i) (අ) වෛද්‍යවරිය රෝගියා පරීක්ෂා කළාය.
(ආ) ක්‍රීඩකයෝ තරගය ජය ගත්හ / ගත්තෝ ය.
(ඇ) කම්කරුවා තමාට පැවරුණු කාර්යය ඉටු කළේය.
(ඈ) බාලිකාවෝ මනහර රැඟුමක් ඉදිරිපත් කළහ / කළෝය.
(ඉ) තොපි ගමට ගියෙහු. (ලකුණු 1 x 5 = 05)
(ii) (අ) ඉබ්බා මානකොක්කු දෙන්නාට
(ආ) උගුඩුවා තමාටම
(ඇ) විමලා රණරාල ඇතුළු පිරිසට (ලකුණු 1 x 3 = 03)
(iii) වනේ ගිජිඳාය දුටුවොත් — වනසාය
ළිඳේ පණිඳාය වැටුනොත් — උෟ කාය
අතකින් කරවැලෙකි අතකින් — දඬු බෑය
මරණ තුනක් ඇති මිනිසෙක් — පැණි කෑය (ලකුණු 2 x 1 = 02)